**ශීර්ෂය 114 - ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 114 - ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගොස්තු 16 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. **ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 28,380.03 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 20,890.71 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 7,489.32 ක් හෙවත් සියයට 26.39 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

| **ශීර්ෂය** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 12,595.38 | 12,471.21 | 124.17 | 0.99 |
| මූලධන | 15,784.65 | 8,419.50 | 7,365.15 | 46.66 |
| **එකතුව** | **28,380.03** | **20,890.71** | **7,489.32** | **26.39** |

## 2.2 ආදායම් ගිණුම

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය විසින් 2015 වර්ෂය සඳහා අංක 20.03.02.08 දරන ආදායම් සංකේතය සඳහා එකතුව රු.මිලියන 4,500 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 3,963 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 88.07 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඌනතාවය ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඌනතාවය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.03.02.08 | 4,500 | 3,963 | 537 | 11.93 |

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

#### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 11401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 11.00 | 9.77 | 4.66 | 5.78 | 45.00 | 20.19 |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 9.45 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0013/0112 | 9.34 |
| 6000/0002/00/0016/0102 | 0.11 |
| **එකතුව** | **9.45** |

**2.5 විගණන නිරීක්ෂණය**

**-------------------------**

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**---------------------------------------------------**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**-----------------------------------------------**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|---|
| (i) | හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (iv) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක 1A1/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**3.2 විසර්ජන ගිණුම**

**-----------------**

**අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වැය විෂයයන් 09 ක් සඳහා සළසා තිබුණු රු 61,250,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**(ආ)** වැය විෂයයන් 30 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.3 ආදායම් ගිණුම්

-----------------

අමාත්‍යාංශ ලේකම් ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් අංක 20.03.09.08 දරන ආදායම් සංකේතය සම්බන්ධයෙන් ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට අදාළව රු.මිලියන 4,500 ක ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 3,963 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 88.07 ක් වි තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව ආදායම් සංකේතයට අදාළ අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

### 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

------------------------------------------

විෂය අංක 11401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ)** විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 1,345,560 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 17 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, අදාළ ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**(ආ)** 1996 හා 2007 යන වර්ෂවලදී විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් රු.77,580 ක්ද, 1997 වර්ෂයේදී ස්ථාන මාරු වී ගිය නිලධාරියකුගෙන් රු.10,944 ක ණය මුදලක්ද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් හිඟහිටව පැවැතුණි. හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

### 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

--------------------------------------

### 3.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

--------------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් චක්‍රලේඛයේ උපදෙස් අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, 2015 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරි සැලැස්ම ඉහත චක්‍රලේඛයේ උපදෙස් අනුව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

### 3.6 වත්කම් කළමනාකරණය

--------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ)** **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශය 2016 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ii) 2014 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්තතා, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. අවශ්‍ය ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සාර්ථකව සිදු කිරීමට නොහැකි වූ බව එම වාර්තාවල සඳහන් කර තිබුණි.

**3.7** **විදේශාධාර ව්‍යාපෘති**

------------------------

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මුලාණය යටතේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. එහි ණය ගිවිසුම් අනුව ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 36,166 ක් වී තිබුණු අතර, එම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 5,321 ක් උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාතර - කතරගම නව දුම්රිය මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව විදේශීය සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණි. එම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් විදේශීය සමාගම සමඟ අමාත්‍යාංශය ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුමේ 8.3 වගන්තිය ප්‍රකාරව මූලික අධ්‍යයනයක් කර වැඩ සටහන් ඉදිරිපත් කළ යුතුව තිබුණි. මූලික අධ්‍යයනයක් සිදු නොකර ඉදිරිපත් කර තිබුණු වැඩ සටහන 2016 මැයි 31 දින වන විට අවස්ථා 11 කදී සංශෝධනය කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරු වෙත වැඩ ආරම්භ කිරීම සඳහා ව්‍යාපෘතිය මගින් ලබා දී තිබූ ඇ.ඩො. මිලියන 84.36 ක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් 2016 මාර්තු මාසය වන විට ඇ.ඩො.මිලියන 8.46 ක් නැවත අයකර ගෙන තිබුණි. ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා තවත් මාස 09 ක කාලයක් ඉතිරිව තිබූ අතර ඇ.ඩො.මිලියන 75 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් එම කාලය තුළදී අයකර ගත යුතුව තිබුණි. එම අත්තිකාරම් අය කළ යුතුව තිබුණු ඉතිරි වැඩවල වටිනාකම ඇ.ඩො. මිලියන 150 ක් වී තිබුණි.

(ඇ) සංශෝධිත කොන්ත්රාත් වැඩසටහන් අංක 11 ට අනුව මාර්ගයේ කොටසට ඇතුළත් (Section 01) ඇ.ඩොලර් 185,100 ක් ඇස්තමේන්තු වටිනාකමක් වූ බෝක්කු 03 ක් ඉදිකිරීම 2016 ජූනි මාසය වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට කි.මී. 5.098 ක පැතිබැම් 60 ක් (වම හා දකුණු ඉවුරු සඳහා) නිර්මාණය කිරීමට සැලැසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට කි.මී. 3.54 ක ඉදි කළ යුතු පැතිබැම් 43 ක් සැලැසුමට අනුව ඉදිකිරීම ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කොන්ත්‍රාත්කරු විසින් ඇමරිකානු ඩොලර් මිලියන 53 ක් ඉංජිනේරු ඇස්තමේන්තුව වූ පාලම් හා අනෙකුත් ඉදිකිරීම සඳහා ඇ.ඩො. මිලියන 80 ක් මිල කර තිබුණි. එය ව්‍යාපෘති කමිටු ඇස්තමේන්තුව මගින් ඉංජිනේරු ඇස්තමේන්තුව ඇ.ඩො. මිලියන 53 ක් දක්වා අඩුකර තිබුණි.

පසුව කොන්ත්‍රාත්කරු එය ඇ.ඩො.මිලියන 91ක් දක්වා වැඩි කර ගෙන තිබුණි. එමෙන්ම මෙම ඉදිකිරීම්වල මුලින් තිබූ ප්‍රමාණයන් හා ස්ථානයන් පසුව වෙනස් කර තිබුණු අතර ඒ සඳහා අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රධාන දුම්රිය ස්ථාන 04 ක් සහ උප දුම්රිය ස්ථාන 02 ක් ඉදිකිරීම වෙනුවෙන් ඇ.ඩො. මිලියන 19 ක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණි. 2016 පෙබරවාරි 29 දින වන විට ව්‍යාපෘතිය ආරම්භ කර වසර 2 ½ ක් ගත වී තිබුණත්, පිලදුව, වෙහෙරහේන, බෙලිඅත්ත යන දුම්රිය ස්ථානවල මූලික නිර්මාණය අනුමැතිය ලබා ගැනීමද සියයට 60 ක මට්ටමක පැවතුණු අතර දුම්රිය ස්ථාන 06 ක් වෙනුවෙන් අවසාන අනුමැතිය 2016 පෙබරවාරි මාසය අවසන් වන විටද, ලබාගෙන නොතිබුණි.

(උ) ව්‍යාපෘතිය විසින් දුම්රිය මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් ඇ.ඩො. මිලියන 27 ක් ඇස්තමේන්තුවල අනුමත කර තිබුණ ද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සිල්පර හා රේල්පීලි මිලදී ගැනීම වෙනුවෙන් 2016 ජූනි මාසය වන විටද, මිලදී ගැනීමේ සැලැස්මක් හා ඒ සඳහා කාල සටහනක් සකස්කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි

(ඌ) දුම්රිය මාර්ගයේ සංඥා හා විදුලි සංදේශ පද්ධති ස්ථාපිත කිරීම වෙනුවෙන් ඇ.ඩො.මිලියන 10 ක් ඇස්තමේන්තු කර තිබුණද, පසුව එම වටිනාකම ඉවත් කර ඇස්තමේන්තුව අනුමත කර තිබුණි. 2016 ජූනි 15 දින දක්වා එනම් ව්‍යාපෘතිය අවසන් වීමට ආසන්න වන විටද, සංඥා හා විදුලි සංදේශ පද්ධති ඉදිකිරීමට අවශ්‍ය නිර්මාණ හා සැලැසුම් (Design & Drawing) සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි

(එ) සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට දුම්රිය මාර්ග සඳහා ඉඩම් කැබලි 1,512 ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවරාගෙන තිබුණි. එම ඉඩම් කැබලිවලින් කැබැලි 1,245 ක් සඳහා රු.989,102,585 ක වන්දි ගෙවා තිබුණි. මෙම වන්දි ගෙවීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2006 වර්ෂයේ සිට දුම්රිය මාර්ග ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ කර තිබුණි. විගණිත දිනය වූ 2016 ජූනි 17 දින වන විටත් ඉඩම් කැබලි 122 ක් වෙනුවෙන් වන්දි ගෙවීමේ කටයුතු අවසන් කර නොතිබුණු අතර වන්දි ගෙවීම් ප්‍රමාද වීම මත ගෙවීමට සිදුවන පොලිය සම්බන්ධයෙන්ද තක්සේරුවක් සිදුකර නොතිබුණි.

(ii) ව්‍යාපෘතියට පවරාගත් ඉඩම් කැබලිවල අයිතිය ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කළ දින සිට වන්දි මුදල් ගෙවීම් කළ දිනය දක්වා සිදු වූ ප්‍රමාදය මත සමාලෝචිත වර්ෂයේදී රු.579,038 ක අතිරේක මුදලක් පොලිය වශයෙන් ගෙවීමට සිදු වී තිබුණි.

(ඒ) ව්‍යාපෘතියේ ඉදිකිරීම් වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට මහජන පැමිණිලි 372 ක් ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගමට එරෙහිව ඉදිරිපත් කර තිබුණි. එම පැමිණිලි අතරින් කොන්ත්‍රාත්කරු විසින් අදාළ ඉදිකිරීම් වෙනුවෙන් යොදා ගන්නා ලද යන්ත්‍ර සූත්‍රවල අධික ශබ්දය නිසා මහජන පැමිණිලි 128 ක් ඉදිරිපත් කර තිබුණි. එම පැමිණිලි අවම කිරීමට සුදුසු යන්ත්‍ර සූත්‍ර භාවිතය සහ සමාජීය බලපෑම අවම කිරීමට කොන්ත්‍රාත්කරු ගත් ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.8 දේශිය මූල්‍යකරණය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**

**ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, ජපාන අන්තර්ජාතික සහයෝගිතා ආයතනය සමග එක්ව 2012 වර්ෂයේදී අධ්‍යනයක් සිදු කර තිබුණි. එම අධ්‍යයනයෙන් ඉඩම් අත්පත් කරගැනීම අවම වශයෙන් සිදුවන පරිදි නවීන මොනෝරේල් දුම්රිය මාර්ග පද්ධතියක් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හරහා මාලබේ සිට කොටුව සහ කොල්ලුපිටිය දක්වා ඉදිකළ යුතු බව අනාවරණය කර ගෙන තිබුණි. ඒ පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් සිදුකර තිබූ අතර එම කටයුතු 2015 දෙසැම්බර් 31 දින වන විට මහා නගර හා බස්නාහිර පළාත් අමාත්‍යාංශයේ ව්‍යාපෘතියක් යටතේ ඉටු කිරීම සඳහා සාකච්ඡා කරමින් පැවතුණි.

(ආ) දුම්රිය මාර්ග ව්‍යාපෘති 07 ක් නව දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘති ලෙස හඳුනාගෙන ඒ සඳහා වර්ෂ 05 කාලයක සිට වාර්ෂික ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. 2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින්ද මේ සඳහා රු.මිලියන 260 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මෙම ව්‍යාපෘති 07 කින් පහත සඳහන් ව්‍යාපෘති 06 ක් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලට පමණක් සීමා කර තිබූ අතර, අමාත්‍යාංශය හෝ එහි කාර්මික අංශය ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට කටයුතු කර නොතිබුණි.

| | **ව්‍යාපෘතිය** | **ප්‍රතිපාදනය** |
|---|---|---|
| | | **රු.මිලියන** |
| (i) | කොට්ටාව හොරණ දුම්රිය මාර්ගය | 05 |
| (ii) | කුරුණෑගල හබරණ හරහා දඹුල්ල දුම්රිය මාර්ගය මාර්ගය | 10 |
| (iii) | කොළඹ හම්බන්තොට කැළණිවැලි දුම්රිය මාර්ගය | 10 |
| (iv) | මැදවච්චිය ත්‍රිකුණාමලය දුම්රිය මාර්ගය | 10 |
| (v) | වැල්ලවාය බිබිල බදුල්ල දුම්රිය මාර්ගය | 10 |
| (vi) | ත්‍රිකුණාමලය මාහෝ පුත්තලම නව දුම්රිය මාර්ගය | 10 |

**3.9 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) **මැතිවරණ කටයුතු සඳහා යොදවා තිබූ රජයේ වාහන වෙනුවෙන් රු.200,000 ක රජයේ ගාස්තු අය නොකිරීම.**

2015 ජූලි 17 දිනැති අංක CSA/1/1/92 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය මගින් 2015 පාර්ලිමේන්තු මැතිවරණ කාල සීමාව තුළ රජයේ නිල වාහන භාවිතා කරනු ලබන අමාත්‍යවරු / නියෝජ්‍ය අමාත්‍යවරු විසින් රු. 100,000 ක මාසික ගාස්තුවක් රජයට ගෙවිය යුතුව තිබුණි. නමුත් අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යාංශය විසින් මැතිවරණ කටයුතු සඳහා ලබා දී තිබුණු වාහන 02 ක් සඳහා රු.200,000 ක මුදල අය කර නොතිබුණි.

**(ආ) අලාභහානි**

 පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය සතු වාහනවලට අනතුරු 19 ක් සිදු වී තිබුණු අතර ඉන් වාහන අනතුරු 08 ක් සඳහා පමණක් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර තිබුණි. ඉතිරි වාහන අනතුරු 11 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව කටයුතු කර රු.497,569 ක් වූ වාහන අනතුරුවලින් සිදු වූ අලාභ හානි සම්බන්ධයෙන් වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 27 | 10 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 03 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 129 | 92 | 37 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 81 | 50 | 31 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 03 | 02 | 01 |
| | එකතුව | **255** | **174** | **81** |

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදා හැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | **සේවක වර්ගය** | **සේවක සංඛ්‍යාව** | **මුදා හැර තිබුණු ආයතනය** |
|---|---|---|---|
| (i) | කාර්යාලීය කාර්ය සහයක | 01 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |
| (ii) | රියදුරු | 01 | වරාය හා නාවික අමාත්‍යාංශය |